සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

63 | S | I

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : .......................................... ව්‍යවසායකත්ව අධ්‍යයනය - I කාලය : පැය 01යි.

වැදගත් :

✳ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ප්‍රශ්න 40 සඳහා ලකුණු 40ක් හිමි වේ.

✳ ප්‍රශ්නයට අදාළව දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඔබට පිළිතුරු සැපයීමට ලබා දී ඇති පිළිතුරු පත්‍රයේ අදාළ කවය තුළ (X) සලකුණ යොදන්න.

(01) ''ව්‍යවසායකත්වය'' යන්න වඩාත් හොඳින් පැහැදිලි කෙරෙන ප්‍රකාශය තෝරන්න.
(1) ව්‍යාපාර අවදානම් භාර ගැනීමට ඇති හැකියාව ව්‍යවසායකත්වයයි.
(2) සම්පත් සම්පාදනය හා ඒවා කළමනාකරණය කිරීමේ හැකියාව ව්‍යවසායකත්වයයි.
(3) නිෂ්පාදන සාධක නිෂ්පාදන ක්‍රියාවලියට යොමු කිරීමේ හැකියාව ව්‍යවසායකත්වයයි.
(4) ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන අවදානම් දරමින් නවෝත්පාදන බිහි කිරීමේ හැකියාව ව්‍යවසායකත්වයයි.

(02) ව්‍යවසායකයෙකු- සතු විය යුතු ව්‍යවසායකත්ව ගුණාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) සුභවාදී වීම, ස්වාධීනත්වය, දක්මක් සහිත වීම.
(2) නම්‍යශීලීත්වය, අවදානම් භාර ගැනීම, ආත්ම තෘප්තිය.
(3) ආත්ම තෘප්තිය, නවෝත්පාදනය, අවදානම් භාර ගැනීම.
(4) නිර්මාණශීලීත්වය, ආත්ම තෘප්තිය, පරිසර සංවේදී බව.

(03) ''නගරයේ ආපනශාලා අතුරින් ප්‍රමුඛයා වීම'' යනු එක්තරා නගරයක පවත්වාගෙන යන ආපන ශාලාවක හිමිකරු විසින් කර ඇති ප්‍රකාශයකි. මෙය මෙම ආයතනයේ,
(1) අදහස විය හැකි ය. (2) දක්ම විය හැකි ය.
(3) පරමාර්ථය විය හැකි ය. (4) ඉලක්කය විය හැකි ය.

(04) ව්‍යවසායකයා සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ව්‍යාපාරය අරඹා පවත්වාගෙන යයි.
(2) ව්‍යාපාරයේ හිමිකරු ලෙස කටයුතු කරයි.
(3) අවදානම් දරයි. ඒ වෙනුවෙන් ලාභ පාඩු භුක්ති විඳියි.
(4) ව්‍යාපාරයෙන් ප්‍රතිලාභ පමණක් අපේක්ෂාවෙන් කටයුතු කරයි.

(05) භූමිය නමැති නිෂ්පාදන සාධකයට අයත් වන දෑ සඳහා උදාහරණ වන්නේ,
(1) ඉඩම්, ගොඩනැගිලි, අමුද්‍රව්‍ය, පස (2) කර්මාන්තශාලා, ඉඩම්, වනාන්තර, පස
(3) ඉඩම්, ගොඩනැගිලි, මිනිරන්, අමුද්‍රව්‍ය (4) පස, ඉඩම්, ස්වාභාවික වනාන්තර, අමුද්‍රව්‍ය

(06) අසාර්ථක වීම අත්දැකීමක් ලෙස සලකයි. මෙය,
(1) කළමනාකරුවකුගේ ගති ලක්ෂණයකි. (2) ව්‍යාපාරිකයකුගේ ගති ලක්ෂණයකි.
(3) ව්‍යවසායකයකුගේ ගති ලක්ෂණයකි. (4) නායකයකුගේ ගති ලක්ෂණයකි.

(07) නවෝත්පාදන සිදු වන ආකාරයකි.
(1) අනුකරණය කිරීම. (2) අනපේක්ෂිත සිදුවීම.
(3) ප්‍රජා පරිසරයේ වෙනස් වීම. (4) වෙළඳපොළේ වෙනස් වීම.

(08) ගැටළු හා අවස්ථා දෙස බලා ඒවාට තාර්කික විසඳුම් සොයා ගෙන ඒවා ක්‍රියාවට නැගීම හඳුන්වන්නේ,
(1) නම්‍යශීලීත්වය ලෙස ය. (2) නවෝත්පාදනය ලෙස ය.
(3) නිර්මාණශීලීත්වය ලෙස ය. (4) අවදානම් කළමනාකරණය කිරීම ලෙස ය.

(09) අවශ්‍යතා පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) අධ්‍යාපනය, සෞඛ්‍ය, සන්නිවේදනය, ප්‍රවාහනය
(2) ආහාර, දුරකථන, ප්‍රවාහනය, ඇඳුම් පැළඳුම්
(3) ඇඳුම් පැළඳුම්, සන්නිවේදනය, ගමනාගමනය, අධ්‍යාපනය
(4) සන්නිවේදනය, ගමනාගමනය, ආරක්ෂාව, ඇඳුම් පැළඳුම්

(10) අ.පො.ස. (උ. පෙළ) අසමත් සිසුන් සඳහා තාක්ෂණික කුසලතා වර්ධනය කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හඳුන්වන්නේ,
(1) ආයතනික ව්‍යවසායකත්වය ලෙස ය. (2) නිර්මාණශීලී ව්‍යවසායකත්වය ලෙස ය.
(3) ව්‍යාපාර ව්‍යවසායකත්වය ලෙස ය. (4) සමාජීය ව්‍යවසායකත්වය ලෙස ය.

(11) ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට මෙන් ම ආර්ථිකයට ද හිමි වන ප්‍රතිලාභයක් වන්නේ,
(1) ස්වයංපෝෂිත බව ය. (2) රැකියා අවස්ථා ජනනය වීම ය.
(3) දේශීය සම්පත් භාවිතයට ගැනීම ය. (4) ආකර්ශනීය ලාභයක් ඉපයීම ය.

(12) ආර්ථික කටයුත්තක යෙදීම යනු,
(1) ව්‍යාපාරවල ගති ලක්ෂණයකි. (2) ව්‍යාපාරිකයාගේ ගති ලක්ෂණයකි.
(3) ව්‍යවසායකයාගේ ගති ලක්ෂණයකි. (4) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති සමානකමකි.

(13) මෙතෙක් භාවිතයට එක් වී නොතිබූ නව භාණ්ඩයක් හෝ සේවාවක් හෝ ක්‍රියාවලියක් බිහිකිරීම,
(1) දිගුවක් ලෙස හඳුන්වයි. (2) සංකලනයක් ලෙස හඳුන්වයි.
(3) නව සොයාගැනීමක් ලෙස හඳුන්වයි. (4) අනුකරණය කිරීමක් ලෙස හඳුන්වයි.

(14) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම, අලෙවි කිරීම හා සම්බන්ධ සියලු කටයුතුවල නිරත පුද්ගලයන් හඳුන්වනුයේ,
(1) නිෂ්පාදකයින් ලෙස ය. (2) ව්‍යාපාරිකයින් ලෙස ය.
(3) ව්‍යවසායකයින් ලෙස ය. (4) වෙළෙන්ඳන් ලෙස ය.

(15) මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර ඇති වෙනස්කමක් පෙන්නුම් කරන ප්‍රකාශය තෝරන්න.
(1) අවශ්‍යතා විවිධ වන අතර වුවමනා සංකීර්ණ වේ.
(2) අවශ්‍යතා මූලිකව පැනනගින අතර වුවමනා සංකීර්ණ වේ.
(3) අවශ්‍යතා සංකීර්ණ වන අතර වුවමනා මූලිකව පැනනැගීම සිදුවේ.
(4) අවශ්‍යතා අසීමිත වන අතර වුවමනා උප්පත්තියක් සමඟ ඇති වේ.

(16) අභ්‍යන්තර ව්‍යාපාර පරිසර තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන සාධක ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) සම්පත්, අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ
(2) සේවකයෝ, ගනුදෙනුකරුවෝ, තරගකරුවෝ, කළමනාකරුවෝ
(3) කළමනාකරුවෝ, සේවකයෝ, විභව ආයෝජකයෝ, සම්පත්
(4) සම්පත්, තරගකරුවෝ, විභව ආයෝජකයෝ, කළමනාකරුවෝ

(17) සමාජීය ප්‍රශ්නවලට නිර්මාණශීලී විසඳුම් ඉදිරිපත් කළ මහත්මා ගාන්ධි තුමා, මාරිකියුරි මැතිණිය, සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා වැනි ශ්‍රේෂ්ඨයින් අයත් වන්නේ,
(1) අභ්‍යන්තර ව්‍යවසායකත්වයට ය. (2) සමාජීය ව්‍යවසායකත්වයට ය.
(3) ව්‍යාපාර ව්‍යවසායකත්වයට ය. (4) නිර්මාණශීලී ව්‍යවසායකත්වයට ය.

(18) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ලන සේවාවක දැකිය හැකි ලක්ෂණයකි.
(1) ස්පර්ශ කළ හැකි වීම. (2) දෘශ්‍යමාන වීම.
(3) සපයන්නාගෙන් වෙන් කළ නොහැකි වීම. (4) සමජාතීය බව ආරක්ෂා කළ හැකි වීම.

(19) පොලිතීන් භාවිතය නිසා මෑත කාලීනව විවිධ පාරිසරික ගැටලු මතු විය. එයට විසඳුම් ලෙස විවිධ උපාය මාර්ගයන් ක්‍රියාත්මක විය. මෙම උපාය මාර්ගයන් අයත් වන බාහිර පරිසර සාධකය වන්නේ,
(1) ප්‍රජා පරිසරයයි. (2) ගෝලීය පරිසරයයි.
(3) තාක්ෂණික පරිසරයයි. (4) දේශපාලන හා නෛතික පරිසරයයි.

(20) ලොව පුරා රටවල් දේශ සීමාවකින් තොරව බද්ධ වී කටයුතු කිරීම,
(1) නෛතික පරිසරය ලෙස හඳුන්වයි.
(2) ආසන්න පරිසරය ලෙස හඳුන්වයි.
(3) ගෝලීය පරිසරය ලෙස හඳුන්වයි.
(4) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය ලෙස හඳුන්වයි.

(21) ව්‍යාපාරික කාර්යයන්හි නිරත වන පුද්ගලයින් එම ව්‍යාපාරයේ,
(1) සේවකයෝ වෙති. (2) කළමනාකරුවෝ වෙති.
(3) අයිතිකරුවෝ වෙති. (4) නායකයෝ වෙති.

(22) ව්‍යාපාර පරිසර සාධක අතුරින් ව්‍යාපාරයට පාලනය කළ හැකි සාධක ක්‍රියාත්මක වන්නේ ව්‍යාපාරයක,
(1) බාහිර පරිසරය තුළ ය. (2) ආසන්න පරිසරය තුළ ය.
(3) අභ්‍යන්තර පරිසරය තුළ ය. (4) ප්‍රජා විද්‍යාත්මක පරිසරය තුළ ය.

(23) ව්‍යාපාර පරිසර අධ්‍යයනය තුළින් හඳුනා ගනු ලබන වාසිදායක සාධක දෙක වන්නේ,
(1) ශක්තීන් හා දුර්වලතා ය. (2) ශක්තීන් හා තර්ජන ය.
(3) තර්ජන හා අවස්ථා ය. (4) ශක්තීන් හා අවස්ථා ය.

(24) ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේගයක් වන්නේ,
(1) අයිතිකරුවන් ය. (2) කළමනාකරුවන් ය.
(3) සේවකයන් ය. (4) තරගකරුවන් ය.

(25) රජය විසින් දේශීය කර්මාන්ත දිරිමත් කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හඳුන්වන්නේ,
(1) තර්ජනයක් ලෙස ය. (2) අවස්ථාවක් ලෙස ය.
(3) ශක්තියක් ලෙස ය. (4) දුර්වලතාවයක් ලෙස ය.

(26) කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ශක්තියකි.
(1) ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම.
(2) රැකියාවල නිරත පිරිස ඉහළ වීම.
(3) ගතික ව්‍යාපාර පරිසරයට ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය හැකිවීම.
(4) පුද්ගලයින්ගේ ආදායම් විෂමතාවය අඩු කිරීමට කටයුතු කළ හැකි වීම.

(27) ව්‍යවසායකයකු ව්‍යාපාර අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සම්පත් සැපයීම, අවදානම් දැරීම, වැදගත් තීරණ ගැනීම යනාදිය ඉටු කරනු ලබන්නේ,
(1) අයිතිකරුගේ භූමිකාව යටතේ ය. (2) සේවකයාගේ භූමිකාව යටතේ ය.
(3) නායකයාගේ භූමිකාව යටතේ ය. (4) කළමනාකරුගේ භූමිකාව යටතේ ය.

(28) මෑතක දී පොළොන්නරුව ප්‍රදේශයේ ව්‍යාපාරික මට්ටමේ ගොවීන්ට දැඩි නියගයකට මුහුණ දීමට සිදු විය. ''නියගය'' අයත් වන පරිසර සාධකය වන්නේ,
(1) සමාජීය පරිසරයයි. (2) ස්වභාවික පරිසරයයි.
(3) ආර්ථික පරිසරයයි. (4) ප්‍රජා විද්‍යාත්මක පරිසරයයි.

(29) ආයතනයක අභ්‍යන්තර හා බාහිර පාර්ශව අතර තොරතුරු බෙදාහැරීම, අවශ්‍ය තොරතුරු රැස් කිරීම හා ඒවා ක්‍රමානුකූලව වාර්තා කිරීමට ව්‍යවසායකයකු සතු කුසලතා හඳුන්වන්නේ,
(1) මානව කුසලතා ලෙස ය. (2) උපදේශන කුසලතා ලෙස ය.
(3) සංකල්පනාත්මක කුසලතා ලෙස ය. (4) සන්නිවේදන කුසලතා ලෙස ය.

(30) ආයතනයකට අභ්‍යන්තර ව්‍යවසායකයින් අවශ්‍ය වන්නේ,
(1) ආකර්ශනීය ලාභයක් ඉපයීම සඳහා ය.
(2) තම ආයතනය මගින් වෙනත් ආයතනවලට තරඟකාරීත්වයක් ලබා දීම සඳහා ය.
(3) සමාජයේ දැවෙන ප්‍රශ්නවලට නිර්මාණාත්මක විසඳුම් ලබාදීම සඳහා ය.
(4) තම ආයතනය මගින් අන් ආයතනවලට ආදර්ශයක් ලබාදීම සඳහා ය.

(31) කුඩා පරිමාණ ව්‍යාපාරයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයකි.
(1) සේවක සංඛ්‍යාව අඩු වීම.
(2) ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් සැපයීම
(3) දේශීය දැනුම හා සම්පත් බොහෝ විට භාවිතයට ගැනීම.
(4) කාලයාගේ ඇවෑමෙන් මහා පරිමාණ ව්‍යාපාර බවට පත්වීම.

(32) අවදානම හා ප්‍රතිලාභ අතර පවතින සම්බන්ධතාවය දැක්වෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අවදානම ඉහළ නම් ප්‍රතිලාභ පහළ වේ.
(2) අවදානම පහළ නම් ප්‍රතිලාභ පහළ වේ.
(3) අවදානම පහළ නම් ප්‍රතිලාභ ඉහළ වේ.
(4) අවදානම හා ප්‍රතිලාභ අතර සම්බන්ධතාවයකින් නොමැත.

(33) පුද්ගලයකුට තම ජීවිතය පවත්වා ගැනීමට අනිවාර්යයෙන් ම සපුරා ගත යුතු මූලික දෑ හඳුන්වන්නේ,
(1) භාණ්ඩ ලෙස ය. (2) නිෂ්පාදිත ලෙස ය.
(3) අවශ්‍යතා ලෙස ය. (4) වුවමනා ලෙස ය.

(34) පහත සඳහන් වාක්‍ය අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) බොහෝ නවෝත්පාදන බිහි වී ඇත්තේ මහා පරිමාණ ව්‍යාපාර තුළිනි.
(2) මහා පරිමාණ ව්‍යාපාර බොහෝමයක ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට සීමා වී ඇත.
(3) බොහෝ සාර්ථක මහා පරිමාණ ව්‍යාපාරවල ආරම්භක අවස්ථාව කුඩා පරිමාණ ව්‍යාපාරයකි.
(4) කුඩා වෙළඳපොල හිඩැස් සපුරාලීම සඳහා මහා පරිමාණ ව්‍යාපාර කටයුතු කරයි.

(35) ව්‍යවසායයෙකු සිය ව්‍යාපාරය සඳහා ඇති ශක්තීන් හඳුනා ගැනීමට විශ්ලේෂණය කළ යුත්තේ,
(1) ආසන්න පරිසරයයි. (2) අභ්‍යන්තර පරිසරයයි.
(3) ගෝලීය පරිසරයය යි. (4) බාහිර පරිසරයයි.

(36) ''බැංකු පොලී අනුපාතිකය ඉහළ නැංවීම ව්‍යාපාරයකට තර්ජනයකි.'' මෙය අයත් වන පරිසර සාධකය වන්නේ,
(1) ගෝලීය පරිසරයයි. (2) ආසන්න පරිසරයයි.
(3) ආර්ථික පරිසරයටයි. (4) දේශපාලන හා නෛතික පරිසරයටයි.

(37) පරිසරයේ වෙනස්වීම්වලට උචිත වන පරිදි අනුගතවීමට ඇති හැකියාව හඳුන්වන්නේ,
(1) ස්වාධීනත්වය ලෙස ය. (2) ආත්ම විශ්වාසය ලෙස ය.
(3) ස්වයං පෙළඹවීම ලෙස ය. (4) නම්‍යශීලීත්වය ලෙස ය.

(38) වර්තමාන ව්‍යාපාරික ලෝකයේ තරගකාරීත්වය නිරන්තරයෙන් වෙනස්වීමට භාජනය වේ. මෙය හැඳින්විය හැක්කේ,
(1) අවිනිශ්චිතතාවක් ලෙස ය. (2) අභියෝගයක් ලෙස ය.
(3) ව්‍යාපාර අවස්ථාවක් ලෙස ය. (4) ව්‍යාපාරයට බාධාකාරී තත්ත්වයක් ලෙස ය.

(39) බොහෝ විට සම්ප්‍රදායික ක්‍රමයට වෙළඳසල් පවත්වා ගෙන යනු ලබන්නේ,
(1) ව්‍යාපාරිකයින් විසින් ය. (2) නිෂ්පාදකයින් විසින් ය.
(3) ව්‍යවසායකයින් විසින් ය. (4) වෙළෙන්ඳන් විසින් ය.

(40) පාරිභෝගිකයා විසින් ම තම භාණ්ඩ තෝරා ගැනීමේ ක්‍රමය වර්තමානයේ දී බෙහෙවින් ප්‍රචලිත අලෙවි ක්‍රමයකි. මෙම අලෙවි ක්‍රමය හැඳින්වෙන්නේ,
(1) සංකලනයක් ලෙස ය. (2) අනපේක්ෂිත සිදුවීමක් ලෙස ය.
(3) අනුකරණය කිරීමක් ලෙස ය. (4) දිගුවක් ලෙස ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

63 S II

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : .......................................... ව්‍යවසායකත්ව අධ්‍යයනය - II කාලය : පැය 02යි.

වැදගත් :
✳ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(01) රුවනි පෙරේරා ප්‍රදේශයේ ප්‍රසිද්ධ ආපනශාලාවක කලක් සේවය කර ඉන් ඉවත් වී තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කළා ය. සේවයේ යෙදී සිටිය දී ඇය ලද අත්දැකීම් මත වර්තමානයේ දේශීය ආහාර සඳහා වැඩි ඉල්ලුමක් පවතින බවත්, ඖෂධීය ආහාර පාන සඳහා පුද්ගලයන් වැඩි අවධානයක් යොමු කරන බවත්, අවබෝධ කරගත් රුවනි පාසල් සිසුන් සඳහා ඖෂධීය කැඳ වර්ගයක් හඳුන්වා දීමට පෙළඹුනි. රැකියාව තුළින් ඉතිරි කරගත් හොඳ මුදලක් ඇය සතුව පැවතුනි. ''ශක්ති ජනක පානයක්'' ලෙස නම් කළ කැඳ වර්ගය නොබෝ දිනකින් සිසුන් අතර ජනප්‍රිය විය. පාසල් තුළ තම නිෂ්පාදිත අලෙවි කිරීමට ඇය විශේෂ අවසරයක් ද ලබා ගත්තා ය. මේ වන විට සේවකයන් යොදවා ප්‍රදේශයේ සියලු පාසල් තුළ ඇය තම නිෂ්පාදිත බෙදා හරී.

(i) රුවනි තුළ ඔබ දකින ප්‍රබල ව්‍යවසායක ගති ලක්ෂණ 2ක් ලියන්න.

(ii) රුවනිගේ නවෝත්පාදනය සඳහා පදනම් වූ මූලාශ්‍රය කුමක් ද?

(iii) අභ්‍යන්තර පරිසර සාධකයක් ලෙස මෙම ව්‍යාපාරයේ අයිතිකරු සතු ශක්තීන් 2ක් ලියන්න.

(iv) මෙම ව්‍යාපාරයේ ඉලක්ක පාරිභෝගික කණ්ඩායම ලියන්න.

(v) මෙම ව්‍යාපාරයට බලපාන බාහිර පරිසර සාධක 2ක් ලියන්න.

(vi) රුවනිගේ ව්‍යාපාරය තුළින් ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ 2ක් ලියන්න.

(vii) රුවනි විසින් මිනිසාගේ කුමන අවශ්‍යතාවක් ඉටු කරයි ද?

(viii) රුවනිගේ ව්‍යාපාර සඳහා දැක්මක් යෝජනා කරන්න.

(ix) රුවනි කුමන වර්ගයේ ව්‍යවසායකයෙකු ද?

(x) රුවනිගේ ව්‍යාපාරය තව දුරටත් දියුණු කිරීමට ඔබගේ යෝජනාවක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2x10=20)

(02) (i) නිර්මාණශීලීත්වය යන්න හඳුන්වන්න.

(ii) නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 4ක් ලියන්න.

(iii) නවෝත්පාදනය සිදුවන ආකාර 2ක් උදාහරණ සහිතව දක්වන්න.

(iv) අතීත ව්‍යාපාර පරිසරය හා සසඳන විට වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි වාසිදායක ලක්ෂණ 2ක් ලියන්න.

(v) ව්‍යවසායකයෙකුට මුහුණදීමට සිදුවිය හැකි අවදානම් සහගත අවස්ථාවක් සඳහා උදාහරණයක් ලියන්න.

(ලකුණු 2x5=10)

(03) (i) මිනිස් අවශ්‍යතා ඉටු කරන භාණ්ඩවල ලක්ෂණ 2ක් ලියන්න.

(ii) පාසල් සිසුවෙකු ලෙස ඔබට අත්‍යවශ්‍ය වන සේවාවන් 4ක් නම් කරන්න.

(iii) නම්‍යශීලීත්වය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකම් 4ක් ලියන්න.

(v) ව්‍යාපාරවල ගති ලක්ෂණ 2ක් ලියන්න. (ලකුණු 2x5=10)

(04) (i) ව්‍යවසායකත්වයේ යෙදීමෙන් පුද්ගලයෙකුට හිමි වන ප්‍රතිලාභ 4ක් ලියන්න.

(ii) ව්‍යාපාරයක ආසන්න පරිසර සාධක 2ක් නම් කරන්න.

(iii) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකයක් වන සේවකයන් ව්‍යාපාරයට දුර්වලතාවක් විය හැකි ආකාර 2ක් ලියන්න.

(iv) ඔබ සමාජීය ව්‍යවසායකයෙකු නම් ඔබේ ප්‍රදේශය තුළ ඔබ විසින් සිදු කිරීමට බලාපොරොත්තු වන සමාජයීය ව්‍යවසායක කටයුත්තක් ලියන්න.

(v) වෙළඳපොළ හිදැස යනු කුමක් ද? (ලකුණු 2x5=10)

(05) (i) පරිමාණය අනුව ව්‍යාපාර බෙදිය හැකි ආකාර මොනවා ද?

(ii) ව්‍යවසායකයෙකුට සන්නිවේදන කුසලතා අවශ්‍ය වන අවස්ථා 2ක් ලියන්න.

(iii) ව්‍යාපාර පරිසරය තුළ පවතින සැබෑ වෙනස්කම් හඳුනා ගැනීමෙන් ව්‍යාපාරිකයෙකුට ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.

(iv) කුඩා ව්‍යාපාර ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර 2ක් ලියන්න.

(v) ඔබේ ප්‍රදේශයේ පවතින කුඩා ව්‍යාපාර 4ක් නම් කරන්න. (ලකුණු 2x5=10)

(06) (i) කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට හේතු දෙකක් ලියන්න.

(ii) නිෂ්පාදන සාධක අතුරින් ''ප්‍රාග්ධනය'' සඳහා උදාහරණ හතරක් ලියන්න.

(iii) ව්‍යාපාර සඳහා බලපාන බාහිර පරිසර සාධකයක් වන ආර්ථික පරිසරයට අයත් සාධක 2ක් නම් කරන්න.

(iv) පසුගිය කාලය තුළ ශ්‍රී ලංකාවේ දැඩි නියඟයක් පැවතුනි. මෙම තත්ත්වය ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(v) ගෝලීය පරිසරය යනු කුමක් ද? (ලකුණු 2x5=10)

(07) (i) ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ව්‍යාපාර අංශ 3 නම් කරන්න.

(ii) ඉන් එක් ව්‍යාපාර අංශයක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාව සතු මානව නොවන සම්පත් දෙකක් නම් කරන්න.

(iv) ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ වර්තමානයේ දැකිය හැකි නව ප්‍රවණතා 4ක් ලියන්න.

(v) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ දියුණුවට මිනිසා විසින් නිර්මාණය කර ඇති සම්පත් 2ක් ලියන්න.

(ලකුණු 2x5=10)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

63 S I,II

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

### ව්‍යවසායකත්ව අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (11) | 1 | (21) | 1 | (31) | 1 |
| (2) | 1 | (12) | 4 | (22) | 3 | (32) | 2 |
| (3) | 2 | (13) | 3 | (23) | 4 | (33) | 3 |
| (4) | 3 | (14) | 2 | (24) | 4 | (34) | 3 |
| (5) | 4 | (15) | 2 | (25) | 2 | (35) | 2 |
| (6) | 3 | (16) | 1 | (26) | 3 | (36) | 3 |
| (7) | 1 | (17) | 2 | (27) | 1 | (37) | 4 |
| (8) | 2 | (18) | 3 | (28) | 2 | (38) | 1 |
| (9) | 1 | (19) | 4 | (29) | 4 | (39) | 1 |
| (10) | 4 | (20) | 3 | (30) | 4 | (40) | 4 |

(ලකුණු 1 x 40 = 40)

### II පත්‍රය

(01) (i) පරිසර සංවේදී බව / නවෝත්පාදනය නිර්මාණශීලීත්වය

(ii) වෙළඳපොළේ වෙනස්වීම.

(iii) රැකියාවෙන් ලද පලපුරුද්ද, මූල්‍ය ශක්තිය

(iv) පාසල් සිසුන්

(v) ප්‍රජා පරිසරය, නෛතික පරිසරය

(vi) නව භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් වීම.

රැකියා අවස්ථා ජනනය

ප්‍රාදේශීය සංවර්ධනය

රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම.

(vii) ආහාර අවශ්‍යතාව

(viii) ගැළපෙන පිළිතුරට ලකුණු ලබා දෙන්න.

(ix) ව්‍යාපාර ව්‍යවසායකයෙක්

(x) ගැළපෙන පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

(එක් පිළිතුරකට ලකුණු 2 බැගින් ලකුණු 20)

(02) (i) ගැටලු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව සොයා ගැනීමට ඇති හැකියාව නිර්මාණශීලීත්වයයි.

(ii)
- විවිධත්වය ග්‍රහණය කර ගැනීම.
- අසාර්ථකත්වය ඉවසීම
- කුතුහලය දිරිමත් කිරීම
- ගැටලු අභියෝග ලෙස දැකීම.
- නිර්මාණශීලී පුහුණු අවස්ථා

(iii)
- නව සොයා ගැනීමක් -- ගුවන් යානය, දුරකථනය
- දිගුවක් -- විදුලි දුම්රිය
- අනුකරණය -- ජංගම ක්‍රමයට අයිස්ක්‍රීම් බෙදා හැරීම.
- සංකලනය -- හාල් පිටි නිෂ්පාදන

(2ක් නම් කිරීමට ලකුණු 1යි උදාහරණ දැක්වීමට ලකුණු 1යි ගැළපෙන ඕනෑම උදාහරණයකට ලකුණු ලබා දෙන්න.

(iv)
- භාණ්ඩ හා සේවා රාශියක් පැවතීම
- පාරිභෝගිකයා බලවත් වීම.
- ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම.
- සමාජ වගකීම් ඉටු කිරීම.

(v) • විකුණුම් අඩුවීම.
• ස්වාභාවික විපත් පැමිණීම.
• ලාභ අඩු වීම.
• තරඟකාරුවන් පැමිණීම.

(03) (i) ස්පෘශ්‍ය වීම, ගබඩා කළ හැකි වීම, සමාජාතීය බව සපයන්නාගෙන් වෙන් කළ හැකි වීම. (ලකුණු 2යි.)

(ii) අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය, සන්නිවේදන සේවා (ලකුණු 2යි.)

(iii) • පරිසරයේ වෙනස්වීම්වලට අනුව වෙනස්වීමේ හැකියාවයි.
(අදහස සහිත ගැළපෙන පිළිතුරට ලකුණු 2යි.)

(iv) • ආර්ථික කටයුත්තක යෙදීම.
• අවදානමට මුහුණ දීම.
• ගනුදෙනුවල නිරතවීම.
• සම්පත් භාවිතා කිරීම.
• තරඟයට මුහුණ දීම. (ලකුණු 2යි.)

(v) • සම්පත් ගනුදෙනුවල යෙදවීම
• ගනුදෙනු අඛණ්ඩව සිදුවීම.
• අරමුණක් පැවතීම.
• අවදානමක් පැවතීම
• ආර්ථික කටයුත්තක් වීම. (ලකුණු 2යි.)

(04) (i) • ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම
• කාර්යයන්හි විවිධත්වය ඇතිවීම.
• සමාජයීය සුබ සාධනය සඳහා දායක විය හැකි වීම
• ප්‍රයෝජනයට නොගත් හැකියා යොදා ගත හැකි වීම.
• ආකර්ශනීය ලාභයක් ඉපයීම.
(පිළිතුරු 2ට ලකණු 2යි.)

(ii) ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, තරඟකරුවන්, සමාන නිෂ්පාදිත සපයන්නන් (පිළිතුරු 2ට ලකණු 2යි.)

(iii) අකාර්යක්ෂම වීම, නුපුරුදු බව, දුර්වල ආකල්ප ගැළපෙන වෙනත් පිළිතුරු 2ක් සඳහන් කර ඇත්නම් ලකුණු 2යි.

(iv) ගැළපෙන පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 2යි.)

(v) වෙළඳපොළේ සිටින පාරිභෝගිකයන් ඉටු නොවූ අවශ්‍යතාවලින් යුක්තව සිටීම. (ලකුණු 2යි.)

(05) (i) • කුඩා පරිමාණ ව්‍යාපාර
• මධ්‍ය පරිමාණ ව්‍යාපාර
• මහා පරිමාණ ව්‍යාපාර (ලකුණු 2යි.)

(ii) තොරතුරු රැස් කිරීමට, තොරතුරු බෙදා හැරීමට, තොරතුරු වාර්තා කිරීම. ලකුණු 2යි.)

(iii) • ව්‍යාපාර පරිසරය සතු ශක්තීන් හඳුනාගැනීම.
• ව්‍යාපාර පරිසරයේ අවස්ථා හඳුනාගැනීම.
• තර්ජන හඳුනා ගැනීම.
• සැලසුම් සකස් කිරීම පහසුවීම.
• වෙනස්වීම්වලට අනුගතවිය හැකිවීම. (ලකුණු 2යි)

(iv) සේවා නියුක්තිය වැඩිවීම, ජාතික නිෂ්පාදිතය වැඩි වීම, ආදායම් බෙදී යාමේ විෂමතාව අඩුවීම, දේශීය සම්පත් /දැනුම භාවිතය ලකුණු 2යි.)

(v) ගැළපෙන පිළිතුරු 2ට ලකුණු 2යි.

(06) (i) • මුදල් පාලනය දුර්වල වීම.
• තරඟකාරීත්වයට මුහුණදීමට අපහසු වීම.
• සැලසුම් නිවැරදිව පාලනය නොකිරීම.
• දුර්වල මානව සම්බන්ධතා
(කරුණු 2ට ලකුණු 2යි)

(ii) ගොඩනැගිලි, යන්ත්‍ර, ඉඩම්, වාහන (ලකුණු 2යි)

(iii) පොලී අනුපාතය, මිල මට්ටම, සේවා නියුක්තිය, වැටුප් විදේශ විනිමය අනුපාතය (ලකුණු 2යි)

(iv) යහපත් හෝ අයහපත් බලපෑම් තර්කානුකූලව ඉදිරිපත් කර ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ලකුණු 2යි)

(v) ලොව පුරා රටවල් දේශ සීමාවන්ගෙන් තොරව බද්ධ වී කටයුතු කිරීම ගෝලීය පරිසරයයි.

(07) (i) ප්‍රාථමික අංශය, ද්විතීයික අංශය, තෘතියික අංශය (ලකුණු 2යි)

(ii) පැහැදිලි කිරීමට ලකුණු 1යි. උදාහරණ දැක්වීමට ලකුණු 1යි.

(iii) ස්වාභාවික සම්පත්, ඛණිජ සම්පත්, සංස්කෘතික සම්පත්, ස්වාභාවික වනාන්තර, සත්ත්ව සම්පත

(iv) ගැළපෙන පිළිත-රු 2ට ලකුණු 2යි.

(v) ගුවන් තොටුපල, වරාය, අධිවේගී මාර්ග, සංචාරක හෝටල් නගර අලංකරණ (ලකුණු 2යි)